# යුගයක අත්දැකීම

# මගෙන් සිගරැට් ඉල්ලන්න ආවා!

සිංහල පාසැලේ දී උඩරට නැටුමට නොතේරුණා වගේ පසුබෑමක් නාලන්දා විද්‍යාලයේ දී සිදුවිය. එය නම් තාවකාලික නො වේ. ශිෂ්‍ය භට කණ්ඩායමට එකතු වී පුහුණු සරඹවලට පමණක් නොව හුණුපිටියේ වෙඩි තැබීමේ පුහුණුවට ද ගිය මම අන්තිම තේරීමේ දී ප්‍රතික්ෂේප කරනු ලදිමි. හේතුව වූයේ වයස දැයි නො දනිමි. එක් දිනකට වඩා මම ඒ ගැන නොතැවුණෙමි. එසේ වුව ද මා ලද පරාජයක් ලෙසින් සිත්හි කා වැදී ඇත. ශිෂ්‍ය භට අභ්‍යාස හේතු කොට ඒ භාරව සිටි මේජර් අබයකෝන් හඳුනා ගන්නට ලැබීම මට ලොකු දෙයකි. මට කිසි දිනක නුගැන්වූ ඔහු ජ්‍යෙෂ්ඨ විභාග ප්‍රතිඵල නිකුත් වීමෙන් අනතුරුව මා වෙත සතුට පළ කළ ගුරුවරුන්ගෙන් මුල් තැනක් ගනියි. කලින් එබඳු සැලකිල්ලක් නොලත් මට එබන්දක් අමතක නොවන්නේ ය. පළමුවැනි පන්තියේ සාමාර්ථයක් ලද කිහිප දෙනා අතුරින් කෙනකු වූ මට ලන්ඩන් මැට්‍රිකියුලේෂන් විභාගයෙන් නිදහස් කිරීමක් ද ලැබුණේ ය. මා මෙන් විෂය හතරකින් විශිෂ්ට සමාර්ථ ලැබූවකු විදුහලේ සිටියාදැයි මතක නැත.

ජ්‍යෙෂ්ඨ පන්තියේ දී අපට ගණිතය උගන්වන්නට කීප දෙනෙක් ම පැමිණිය හ. ජේ. එන්. ජිනේන්ද්‍රදාස මහතාගෙන් අනතුරුව විදුහල්පති ධුරයට පත් වූ ඩී. සී. ලෝරිස් මහතා සහ 'කොටා' යන අන්වර්ථ නාමයෙන් ශිෂ්‍යයන් විසින් හඳුන්වනු ලැබූ ජයරත්න මහතා ද ඒ අතර වූහ. (ඔහුගේ බාල සොහොයුරු සීසර් ද සිල්වා ජයරත්න සිටියේ අපේ පන්තියේ ය) එවකට උප විදුහල් ධුරය දැරූ ඔහු පසුව විදුහල්පති පදවිය ද ඉසිලීය. ශිෂ්‍යයන්ගෙන් දැඩි ශික්ෂණයක් බලාපොරොත්තු වූ ඔහු කෙරෙහි පැහැදීමක් ඔවුන් තුළ නොවීම සාධාරණ ය. විනාඩි පහක් පමා වී පැමිණිය ද ඔහුගෙන් සමාවක් නැත. ජයරත්න මහතා කෙරෙහි විරෝධය ඔහු විදුහලෙන් පන්නා ගැනීමේ ව්‍යාපාරයක් බවට උග්‍ර වූයේ කෙසේ දැයි නො දනිමි. එහෙත් කෙටි කාලීන අසාර්ථක උද්ඝෝෂණයක් දියත් කරන්නට ශිෂ්‍ය පිරිසක් සමත් වූහ. එහි නායකත්වය ගත්තවුන් අතර කැපී පෙනුණේ (පසු ව මිනින්දෝරුවකු වූ) ලියනසූරිය නමැති ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෙකි. උද්ඝෝෂණයේ එක් අවස්ථාවක පාසැල් වේලාවෙන් අනතුරුව ශිෂ්‍යයන්ගේ රැස්වීමක් ප්‍රාථමික අංශයේ පන්ති කාමරයක පැවැත්වූ බව මතකය. එහි දී මුලින් ම කතා කළ ලියනසූරිය ගේ එක වාක්‍යයක් මගේ දෙසවණ අදත් පිළිරැව් දෙයි. එය සිංහලෙන් දැක්විය හැක්කේ මෙසේ ය:

''මේ දුෂ්ටයා වහාම තුරන් කළ යුතුයි''

දුෂ්ටයා තුරන් කලේ නැත. උද්ඝෝෂකයන්ට අතුරු අන්තරාවක් වූයේ ද නැත. මේ සිද්ධිය සිහි කරත් ම මතක් වන තවත් වචන කිහිපයක් අප ඉදිරියේ ප්‍රකාශ කලේ විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි. ඒ අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල මහතා දණ්ඩෙමුව ආසනය දිනා පාර්ලිමේන්තුවට ආ අළුත යයි සිතමි. ශිෂ්‍යයන් ඉදිරියේ ප්‍රකාශ පැවැත්වූ දේශනයකදී තමාගේ ශිෂ්‍ය ජීවිතය සිහිපත්කළ ඔහුගේ වාක්‍යය මෙසේය. දේශනය සිංහලෙන් ය.

''මම පැය විසි හතරක් ඇතුළත විද්‍යාලයෙන් තෙරපනු ලැබූ ශිෂ්‍යයෙක්.''

තවත් ආදි ශිෂ්‍යයකු වූ ආර්.එස්.එස්.ගුණවර්ධන මහතා පැමිණියේ උදෙන් ම විදුහල් බිමේ රැස් වූ ශිෂ්‍ය පිරිස අමතා කතා කිරීමට ය. මට සිහිපත් කළ හැක්කේ එය විශේෂ අවස්ථාවක් වූ බව පමණි. ගුණවර්ධන මහතා එවකට අප රට වෙනුවෙන් පිටරටක පෙනී සිටියේ යයි සිතමි. ඔහුගේ ප්‍රෞඪලීලාව සහ දේශනය ද අප තුළ ඔහු කෙරේ ගෞරවයක් ඇති කරන්නට සමත් විය.

අපට බුද්ධාගම උගන්වන්නට පැමිණි භික්ෂූන් වහන්සේ තුන් නම තුන් ආකාරයක පුද්ගලයෝ වූහ. ඉතා කෙටි කලක් අපට ඉගැන්වූ ගුන්නැපාන වජිරඥාණ හාමුදුරුවෝ කඩවසම් පුරුෂයෙකි. එතරම් ගෞරවයක් ශිෂ්‍යයන් තුළ ජනිත කරවන්නට සමත් වූ කෙනෙක් නොවූහ. හෙට්ටිමුල්ලේ වජිරබුද්ධි හාමුදුරුවෝ වඩාත්ම මුඛරි පුග්ලයා වූහ. එජාපයේ ප්‍රබල ආධාරකරුවකු වූ උන්වහන්සේ මට අන්තිමට මුණ ගැසුණේ ගුවන් විදුලි සංස්ථාවේ දී ය. එවකට එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකුව සිටියදී ය. මට එතෙක් මුණ ගැසුණු දක්ෂම ඉංගිරිසි කථිකයා (භික්ෂූන් අතුරින්) වූයේ ගලපාත බේමානන්ද හාමුදුරුවෝ ය. උගන්වන අතරවාරයේ රසවත් පරණ කතන්දර කීම ද උන්වහන්සේගේ සිරිතක් විය. අරළු ගෙඩියක් ඉල්ලා ගන්නට පන්සලකට ගිය බමුණා හිස් අතින් ආපසු එමින් කී 'ගාථාව' මම මගේ 'සිංහරු සිරිතෙහි' ලා උපුටා දැක්වූයෙමි. ඊටත් වඩා ලස්සන කතාවක් මට අදත් මතකය. බණ්ඩාරවෙල පළාතේ බස් රියක නැගී ගමන් කරන වයසක හාමුදුරු නමක් සෑහෙන්න සීතල දවසක්, හොඳට රෑත් වෙලා, හාමුදුරුවෝ සුරුට්ටුවක් දල්වාගෙන උරන්නට පටන් ගත්හ. ළඟින් ම හිටි වැඩිහිටි බෞද්ධයෙක් උන්වහන්සේට කිට්ටු විය.

''හාමුදුරුවනේ දුම් බොන එක සංඝයා වහන්සේලාට වටින්නේ නැහැ නේද ?''

ඔහු ගරු සරු ඇතිව ප්‍රශ්න කළේය. හාමුදුරුවන් පිළිතුරු දෙන්නේ කිසි පැකිළීමක් නැතිව ය.

''ඇයි ? උපාසක මහත්තයෝ දන්නේ නැද්ද, බුදුහාමුදුරුවෝ දේශනා කරල තියෙන හැටි ?''

ධූම පානම්හි භික්ඛූනං
නිච්චමේව න වට්ටති
සීත කාලේව හත්තේ ච
අනුජානාමි භික්ඛවේ

නිතරම හොඳ නැති වුණත් සීතල වේලාවටයි දානේ වැළඳීමෙන් පස්සෙයි දුම් බොන එකේ වරදක් නැහැ කියලයි කිව්වේ.''

යනුවෙන් ගාථාවේ තේරුම ද පැහැදිලි කර දුන්හ. උපාසක මහතාට දිය හැකි උත්තරයක් නැත.

ගුරුවරයකුට ද වැඩියෙන් තෙදබල පෙන්වූ පුද්ගලයකු අමතක කළ නොහැකි ය. නාලන්දා විද්‍යාලය එවකට පැවැත්වුණේ පරණ ගොඩනැගිල්ලක ය. එක් පසකින් වූ දෙමහල් ගොඩනැගිල්ලේ උඩුමහලේ ය අපේ පන්තිය තිබුණේ, අනෙක් පැත්තෙන් වූ ගොඩනැගිල්ලේ උඩු මහල ශිෂ්‍ය නිවාසයට වෙන් ව තිබූ අතර බිම් මහලේ ද පන්ති පවත්වන ලදි. මුළු විදුහලට ම ඇසෙන පරිදි සීනුව නාද කිරීමේ වැදගත් මෙහෙවර ඉටු කලේ දියෝනිස් ය. එකම තැන සිටගෙන දෝතින් ම සීනුව ඔසවා එකම ලතාවකට නාද කරන්නට පුරුදුව සිටි දියෝනිස් අපට අමතක නොවන්නේ ඔහු ගසූ සීනුව නිසා නොව ඔහුගේ කට නිසාය. ඔහු කතා කරන්නේ හොඳට සැර තියලා ය. ගුරුවරයකු කී දෙයකට නැතහොත් ඇසූ ප්‍රශ්නයකට ප්‍රතිචාර වශයෙන්:

''ඒක වත් තේරෙන්නේ නැද්ද''යි කිසි ම ගරු සරුවක් නැතිව ඇසීම ඔහුට පුරුද්දක් වූයේ යයි සිතමි.

නාලන්දාවට ගියත් සමසමාජයෙන් සපුරා ඈත් වීමක් නො වීය. මා ජ්‍යෙෂ්ඨ පන්තියේ සිටිය දීම ඩී.ජේ. වනිගතුංග සහ ජී. පී. (එලිෆන්ට්) පෙරේරා තවත් සගයකු සමග සීවලී පටු මගේ නිවාසක් කුලියට ගෙන පදිංචිව සිටියහ. ඔවුන් කිසියම් ආකාරයකින් පක්ෂය පිරිසිදු කිරීමේ ප්‍රයත්නයක නිරතව සිටි බවය මට සිතිය හැක්කේ, වරක් හෝ දෙවරක් ඔවුන් සිටි නිවසට ගිය මට රාජකාරියක් පවරන ලද්දේ වනිගතුංග විසිනි. සමසමාජ න්‍යාය පැහැදිලි කරමින් කුඩා පොත් කිහිපයක් පළ කරන්නට සිතූ ඔවුහු එකක් පරිවර්තනය කිරීම මට පැවරූහ. ලියොන් ට්‍රොස්කිගේ කෘතියක් වූ එය 'ධනවාදයේ මර ළතෝනිය සහ සිව්වැනි ජාත්‍යන්තරය සතු කාර්යයෝ'' යනුවෙන් වූවකි. මරණ වේදනාව යන්න ''මර ළතෝනිය'' යනුවෙන් සිංහලට නැගුවේ කෙසේදැයි දැන් නිච්චි නැත. එහෙත් එය උචිත පරිවර්තනයක් විය. පොත හළු වූ පසු වනිගතුංග කෙරෙහි අප්‍රසාදයක් හට ගන්නා සිදුවීමක් ද විය. මම පිටපත් තුනක් ඉල්ලා ගත්තෙමි. පසු දිනක මා හමු වූ විටක ''කෝ පොත් තුනේ සල්ලි ?'' යයි ඔහු විමසූ විට නිහඬව සිටියත් එය නොහොබිනා ප්‍රශ්නයක් බව නිතර සිහිපත් විය.

භික්ෂු දේශපාලනය පිළිබඳ නව අර්බුදය මතුවූයේ ද ඒ අවදියේ ය. කරුණාසේන සමඟ භික්ෂු දේශපාලන රැස්වීමක් බලන්නට ගියා මට මතකය. බණ්ඩාරගම පවත්වන ලද එම රැස්වීමට යන මග දෙපස භික්ෂු දේශපාලනයට එරෙහි වූවන්ගේ විරෝධය සහ ප්‍රතිචාර පිළිබිඹු කරන විශාල පුවරු තබා තිබුණි. දෙකක් විශේෂයෙන් ම කැපී පෙනුණේය. එක පැත්තක කළයක්, අනෙක් පැත්තෙන් හුළු ඇත්තක්, චිත්‍ර දෙකට යටින් ලොකු අකුරෙන් ලියන ලද වචන දෙක, රා සහ හුල, දේශපාලන භික්ෂූන්ගේ නායකත්වය දැරූවේ වල්පොල රාහුල හාමුදුරුවෝ ය. පෙරමුණේ සිටි අනෙක් භික්ෂූන් වහන්සේලා දෙදෙනා වූයේ කලල්ඇල්ලේ ආනන්ද සාගර සහ බඹරැන්දේ සිරි සීවලී යන හිමිවරුය. දෙවැනි පුවරුවේ මොල්ලිය සහිත ලොකු ගෙනකුගේ චිත්‍රයක් විය. ගොනාගේ හං වඩුව ඉංගිරිසියෙනි. පිට හරහා පී.එච්.ඩී. යන අකුරු තුනය. ඒ මෙම ව්‍යාපාරයට පක්ෂව පෙරමුණට ආ ගිහි උගතා වූ ආචාර්ය ඩී. පී. සොයිසාට එල්ල කළ ප්‍රහාරයකි.

යුද්ධය නිසා කල් තබන්නට සිදු වූ ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණයට දේශපාලකයන් පෙළ ගැසෙමින් සිටි මෙම අවදිය පල්ලිය කෙළින්ම එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙන්නැයි බැතිමතුන්ට කියූ කාලයක් විය. ආගම ඡන්ද ව්‍යාපාරයට ඈඳා ගැනීම පහසු ද විය. මෙය වඩාත් ම ප්‍රකට වූයේ හන්දියක් ගානේ ප්‍රදර්ශනය කළ දැවැන්ත ප්‍රචාරක දැන්වීම් වලිනි. බී. ජේ. ප්‍රනාන්දු බස් කොම්පැනිය සතු බොරැල්ලේ බස් නැවතුම් පොළේ සිටුවා තිබුණු මෙබඳු පුවරු අපට නිරත දෙවේලේ ඇස ගැසුණේය. ආගම ඔස්සේ තදින් පහර එල්ල වූයේ එවකට සෑහෙන ජන බලයක් දිනා ගනිමින් තිබූ ලංකා සමසමාජ පක්ෂයට ය. සමසමාජයෙන් එකී ආගම් බේරා ගනු යනුවෙන් ලියැවුණු වගන්තියට යටින් සමසමාජ ගින්නෙන් දැවෙන පන්සලක, පල්ලියක, කෝවිලක නොහොත් මුස්ලිම් පල්ලියක වර්ණ සිතුවමක් ද විය.

දේශපාලන භික්ෂුහු මෙම ගිනි දෙන්නන්ට පක්ෂව වේදිකාවට පිවිසියහ. හතළිස් හතේ මැතිවරණයට පෙර පොලිසියේ වෙඩි පහරකින් මිය ගිය කන්දසාමි අනුස්මරණය ද මට සිහිවෙයි. කොම්පඤ්ඤ වීදියේ තැනක පැවැත්වුණු කන්දසාමි අනුස්මරණ රැස්වීමක මුලසුනේ සිටියේ වල්පොල රාහුල හාමුදුරුවෝ ය. උන්වහන්සේ ඉංගිරිසියෙන් සභාව අමතමින් එඩ්මන්ඩ් සමරකොඩිට කතා කරන්නට ඇරයුම් කළේ මෙසේ ය

''දැන් ඔබ අමතා කතා කරන්නේ මීරිගමින් ඩී. එස්. සේනානායක පරද්දන්නට යන එඩ්මන්ඩ් සමරකොඩි සහෝදරයා''

කම්කරු විප්ලවය ගැන අදහමින් වුව ද නිදහස් ඡන්දය පිළිබඳව කිසියම් විශ්වාසයක් හා ගෞරවයක් මා තුළ රැඳී තිබුණ බ වමට ම මතක් කර දෙන වැඩක් මා විසින් ඉටු කරන ලදදේ මැතිවරණයට මාස ගණනකට පෙර ය. තැපැල් කන්තෝරුවක් බඳු තැනකදී ඡන්දදායක ලැයිස්තුවක් බැලීමේ දී කරව්ගේනේ තුන්දෙනකුගේ නම් ඇතුළත්ව නොතිබුණු සැටි මම දුටුවෙමි. එබන්දක් ලැයිස්තුවට එකතු කිරීම සඳහා වූ ආකෘති පත්‍ර තුනක් ලබා ගත් මම තුන්දෙනා ම හමු වන්නට ගොස් ඔවුන්ගේ අත්සන් යොදා ගෙන යැව්වෙමි. එසේ කළේ ඔවුන් නිසක වශයෙන් ම එජාප අපේක්ෂක ඒ. පී. ජයසූරිය මහතාට ඡන්දය දෙන බව දැන දැනම ය. ඔවුන්ගේ එම අයිතිය අහිමි කොකළ යුතු බවට දැඩි විශ්වාසයක් මා තුළ විය. ඒ මැතිවරණයේ දී මට ඡන්දයක් නො තිබුණි. විසි එකෙන් වැඩි අයට පමණි ඡන්ද බලය හිමි වූයේ, එහෙත් මම මගේ සිත් දිනාගත් පක්ෂය වෙනුවෙන් වැඩ කළෙමි. සමසමාජ පක්ෂයෙන් ඉදිරිපත් වූ අපේක්ෂකයා ධර්මපාල විද්‍යාලයේ ගුරුවරයකු වූ එම්. ටී. පීරිස් ය. ඒ වන විට ධර්මපාල විද්‍යාලයේ උගනිමින් සිටි සිරිවර්ධන මල්ලී (මහප්පාගේ පුතා) ඔහුගේ ගෝලයෙක් විය. මෙයත් මගේ උනන්දුවට හේතුවක් විය. හාන්දුපැල්පොල පැවැත්වුණු ප්‍රචාරක රැස්වීමක මම පක්ෂය වෙනුවෙන් කතා කළෙමි.

ඡන්දය දා උදෙන්ම සිරිවර්ධනත් මමත් ගමේ ඡන්ද පොළට ගියෙමු. පොළට කීවාට ශාලාවට නොගොස් ළඟම ඇති කඩයේ රැඳී උන්නෙමු. ගමේ, පළාතේ ප්‍රබල එජාප ආධාරකරුවා වූ එඩ්මන්ඩ් අමරසේකර මහතා කඩයට ගොඩ වුණේ අලියා ලකුණ සහිත ලේබල් ගොඩක් අතැතිව ය. එක් කොනක සිට එක් එක් කෙනාට පපුවේ ගහ ගන්නයි කියමින් ලේබලය බැගින් බෙදා දෙන්නට විය. අපි දෙන්නා අත ඉක්මන් කොට අප ළඟ තිබුනු කුරුල්ලා ලේබලය ගසා ගතිමු. අමරසේකර මහතා අප සමඟ කතා නොකරම ඉවතට ගියේ ය. අප කාගේ කවුරුන්දැයි ඔහු දැන සිටියාදැයි නො දනිමි. එතැන් සිට කාරයක නැගී හොරණට යන ගමන් සිගරැට්ටුවක් ගන්නට නැවැතුවේ මා හඳුනන කඩයක් ළඟය. බාප්පාගේ, ගේ තනන්නට ආ බාස් උන්නැහේ ය කඩය අයිතිකරු, ඔහු දොරකඩ ම සිටියේ ය.

''සිගරැට් නැහැ මහත්තයෝ''

සිගරැට් ඉල්ලූ මට ඔහු උත්තර දුන්නේ සද්දේ ඇහුව ය. එයත් පපුවේ ගසා ගත් කුරුල්ලා නිසා විය යුතු ය. මගේ සැකය තහවුරු වූයේ ඔහු මා දන්නා කෙනකුට දුන් වාර්තාව ඇසූ විටය.

''මගේන් සිගරැට් ඉල්ලන්න ආවා. මෙහේ ඇති සිගරැට් එකක් නැහැයි කියලා මං පිටත් කරගත්තා.''

එතැනින් අප ගියේ හොරණ සමසමාජ කාර්යාලයට ය. බෝගහ හන්දිය පසුකොට අඟුරුවාතොට පාරේ මඳ දුරක් ගිය විට (පරණ) ඉරිදා පොළ ඉස්සරහින් ම වාගේ වම් පැත්තේ දෙමහල් ගොඩ නැගිල්ලක උඩ තට්ටුවේ තිබුණ කාර්යාලයට ගිය මා